ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2020/72 - 2017 මැයි මස 26 වැනි සිකුරාදා - 2017.05.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:*බල/2/1/4/05.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* LD/05/2002/PC/244.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :*

ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 88ඒ, කන්දෙගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද ගා. 4171 හා 2016.09.18 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01, 02, 03, 04, 05 ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0397 ක් පමණ වූ වෙලබොඩවත්ත, දෙල්ගහවත්ත සහ මරදානෙවත්ත *නොහොත්* කනත්තෙ දෙල්ගහවත්ත නැමති ඉඩම් කන්දෙගොඩ දෙවට පාර, රණසිංහ නැමැති අයගේ ඉඩමේ ඇළ අද්දර දිගේ අම්බලන්ගොඩ මායිම දක්වා පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම.

1\. **කැබලි අංක 01 — වෙලබොඩවත්ත — ප්‍රමාණය හෙක්ටයාර් 0.0086**

*උතුරට*: දෙවට පාර සහ ඇළ ; *නැගෙනහිරට*: ඇළ සහ මෙම පිඹුරේ කැබලි අංක 2; *දකුණට*: මෙම පිඹුරේ කැබලි අංක 2, පොල්ගම්පලගෙයි සම්පත් රණසිංහ හිමිකම් කියන වෙලබොඩවත්ත සහ පොල්ගම්පලගෙයි ලසන්ත රණසිංහ හිමිකම් කියන වෙලබොඩවත්ත; *බටහිරට*: පොල්ගම්පලගෙයි ලසන්ත රණසිංහ හිමිකම් කියන වෙලබොඩවත්ත සහ දෙවට පාර.

2\. **කැබලි අංක 02 — වෙලබොඩවත්ත — ප්‍රමාණය හෙක්ටයාර් 0.0091**

*උතුරට*: මෙම පිඹුරේ කැබලි අංක 1 සහ ඇළ; *නැගෙනහිරට*: ඇළ සහ මෙම පිඹුරේ කැබලි අංක 3; *දකුණට*: මෙම පිඹුරේ කැබලි අංක 3, කෝසමා තනුෂා දමයන්ති හිමිකම් කියන දෙල්ගහවත්ත සහ පොල්ගම්පලගෙයි සම්පත් රණසිංහ හිමිකම් කියන වෙලබොඩවත්ත; *බටහිරට*: පොල්ගම්පලගෙයි සම්පත් රණසිංහ හිමිකම් කියන වෙලබොඩවත්ත, පොල්ගම්පලගෙයි රණසිංහ හිමිකම් කියන වෙලබොඩවත්ත සහ මෙම පිඹුරේ කැබලි අංක 01.

3\. **කැබලි අංක 03 — දෙල්ගහවත්ත — ප්‍රමාණය හෙක්ටයාර් 0.0069**

*උතුරට*: මෙම පිඹුරේ කැබලි අංක 2 සහ ඇළ (මු.පි. 483/F 126); *නැගෙනහිරට*: ඇළ (මු.පි. 483/F 126) සහ මෙම පිඹුරේ කැබලි අංක 4; *දකුණට*: මෙම පිඹුරේ කැබලි අංක 4, අමිතාවලි යසෝමා ද සිල්වා ජසෙන්තුලියන හිමිකම් කියන මරදානෙවත්ත *නොහොත්* කනත්තෙ දෙල්හවත්ත (මු.පි. 483/F 126) සහ

තනූෂා දමයන්ති හිමිකම් කියන දෙල්ගහවත්ත (මු.පි. 483/F 126); *බටහිරට*: කෝසමා තනූෂා දමයන්ති හිමිකම් කියන දෙල්ගහවත්ත (මු.පි. 483/F 126) , පොල්ගම්පලගෙයි සම්පත් රණසිංහ හිමිකම් කියන වෙලබොඩවත්ත (මු.පි. 483/F 126) සහ මෙම පිඹුරේ කැබලි අංක 2.

**4. කැබලි අංක 04 — මරදානෙවත්ත *නොහොත්* කනත්තෙ දෙල්ගහවත්ත— ප්‍රමාණය හෙක්ටයාර් 0.0082**

*උතුරට*: මෙම පිඹුරේ කැබලි අංක 3 සහ ඇළ (මු.පි. 483/F 126) ; *නැගෙනහිරට*: ඇළ (මු.පි. 483/F 126) සහ මෙම පිඹුරේ කැබලි අංක 5; *දකුණට*: මෙම පිඹුරේ කැබලි අංක 5, ජසෙන්තුලියන අනිල් හේමසිරිල් උපාලි හිමිකම් කියන මරදානෙවත්ත *නොහොත්* කනත්තෙ දෙල්ගහවත්ත (මු.පි. 483/F 126) සහ යසෝමා ද සිල්වා ජසෙන්තුලියන හිමිකම් කියන මරදානෙවත්ත *නොහොත්* කනත්තෙ දෙල්ගහවත්ත (මු.පි. 483/ F 126) ; *බටහිරට*: අමිතාවලි යසෝමා ද සිල්වා ජසෙන්තුලියන හිමිකම් කියන මරදානෙවත්ත *නොහොත්* කනත්තෙ දෙල්ගහවත්ත (මු.පි. 483/F 126) , කෝසමා දමයන්ති හිමිකම් කියන දෙල්ගහවත්ත (මු.පි. 483/F 126) සහ කැබලි අංක 3.

**5. කැබලි අංක 5 — දෙල්ගහවත්ත *නොහොත්* කනත්තෙ දෙල්ගහවත්ත— ප්‍රමාණය හෙක්ටයාර් 0.0069**

*උතුරට*: මෙම පිඹුරේ කැබලි අංක 4 සහ ඇළ (මු.පි. 483/F 126) ; *නැගෙනහිරට*: ඇළ (මු.පි. 483/F 126) සහ මාර්ගසති පාර; *දකුණට*: මාර්ගසති පාර සහ ජසෙන්තුලියන අනිල් හේමසිරිල් උපාලි හිමිකම් කියන මරදානෙවත්ත *නොහොත්* කනත්තෙ දෙල්ගහවත්ත (මු.පි. 483/F 126) ; *බටහිරට*: ජසෙන්තුලියන අනිල් හේමසිරිල් උපාලි හිමිකම් කියන මරදානෙවත්ත *නොහොත්* කනත්තෙ දෙල්ගහවත්ත (මු.පි. 483/ F 126) , අමිතාවලි යසෝමා ද සිල්වා ජසෙන්තුලියන හිමිකම් කියන මරදානෙවත්ත *නොහොත්* කනත්තෙ දෙල්ගහවත්ත (මු.පි. 483/F 126) සහ කැබලි අංක 4

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුම දෙනා තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 සැප්තැම්බර් මස 07 වැනි දින පෙ.ව. 10.00 ට බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 සැප්තැම්බර් මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එම ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

බී. පී. එස්. අනුරාධි,
ප්‍රාදේශීය ලේකම්,
බලපිටිය.

2017 මැයි මස 24 වැනි දින,
බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-373

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.